# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1816/6 - 2013 ජුනි මස 25 වැනි අඟහරුවාදා 2013.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : 3/1/3/15.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : 4/3/9/2011/WS/226.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ සුළු කොට්ඨාසයේ, පොත්ගොඩ ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2013.05.18 දිනැති අංක මහ 6263 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන "ගලපිටහේන" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0275 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

**1. කැබලි අංක 1 ; ඉඩමේ නම: ගලපිටහේන ; ප්‍රමාණය: හෙක්. 0.0158 ; මායිම්:**

| | |
|---|---|
| *උතුරට* | : සෝමා කුලසේකර හිමිකම් කියන ගලපිටහේන සහ බී. ජී. පියසීලි හිමිකම් කියන ගලපිටහේන; |
| *නැගෙනහිරට* | : බී. ජී. පියසීලි හිමිකම් කියන ගලපිටහේන, එම්. බී. සමරකෝන් හිමිකම් කියන ගලපිටහේන සහ රජයට අයත් ගලපිටහේන; |
| *දකුණට* | : රජයට අයත් ගලපිටහේන සහ කැබලි අංක 2; |
| *බටහිරට* | : කැබලි අංක 2, ජේ. එස්. එම්. ලීලාවතී හිමිකම් කියන ගලපිටහේන සහ සෝමා කුලසේකර හිමිකම් කියන ගලපිටහේන. |

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය:*

1. සෝමා කුලසේකර මහත්මිය, පොත්ගොඩ, මාරස්සන.

**02. කැබලි අංක 2 ; ඉඩමේ නම: ගලපිටහේන ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0117 ; මායිම්:**

| | |
|---|---|
| *උතුරට* | : සෝමා කුලසේකර හිමිකම් කියන ගලපිටහේන සහ කැබලි අංක 1; |
| *නැගෙනහිරට* | : කැබලි අංක 1 සහ රජයට අයත් ගලපිටහේන; |
| *දකුණට* | : රජයට අයත් ගලපිටහේන සහ ආර්. බී. බස්නායක හිමිකම් කියන ගලපිටහේන; |
| *බටහිරට* | : ආර්. බී. බස්නායක හිමිකම් කියන ගලපිටහේන සහ ජේ. එස්. එම්. ලීලාවතී හිමිකම් කියන ගලපිටහේන. |

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය:*

1. සෝමා කුලසේකර මහත්මිය, පොත්ගොඩ, මාරස්සන.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00 ට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 සැප්තැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

මධුපානි පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට.

2013 ජුනි මස 21 වැනි දින,
පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තුලාතුඹය.

07 - 222


1A - G 017844 - 340 - (2013/06)



*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: ගඉකෝ/ප්‍රාලේ/6/4/3/09.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2008/WS/317.

උක්ත ශීර්ෂය යටතේ 2013 මැයි මස 09 වැනි දින ම විසින් අංක 1809/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* අංක 05 - 617 යටතේ පළ කරන ලද ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි, සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
| --- | --- |
| 2013 ජුනි 12 | 2013 සැප්තැම්බර් 25 |
| 2013 ජුනි 05 | 2013 සැප්තැම්බර් 18 |

ටී. ඒ. ඩී. ඩබ්. දයානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ.

2013 ජුනි මස 20 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 223

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.